# පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - තිහගොඩ ප්‍රාදේශීය සභාව

## පුරප්පාඩුව පවතින තනතුර - බර උපකරණ යන්ත්‍ර ක්‍රියාකරු

තිහගොඩ ප්‍රාදේශීය සභාවේ බැකෝ යන්ත්‍රය හා අනෙකුත් බර උපකරණ යන්ත්‍ර ක්‍රියාකරවීම සඳහා බර උපකරණ යන්ත්‍ර ක්‍රියාකරුවෙකු දෛනික පදනම මත බඳවා ගැනීමට අවශ්‍යව ඇත. මේ සඳහා අයදුම්පත් 2023.12.13 දින සිට 2023.12.27 දින දක්වා කැඳවනු ලැබේ. සුදුසුකම් පරීක්ෂා කිරීම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

**අවශ්‍ය සුදුසුකම් :**

- මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති මෝටර් රථ රියදුරු බලපත්‍රයක් (බර උපකරණ සහිත ) තිබිය යුතුය.

**වයස :** අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතුය.

**අධ්‍යාපන සුදුසුකම් :**

දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. ( සා.පෙළ ) විභාගයෙන් ඕනෑම විෂයයන් 06 ක් සමත්ව තිබීම හෝ 5 ශ්‍රේණිය ( 6 වසර ) සමත්ව තිබීම හා බර උපකරණ යන්ත්‍ර ක්‍රියා කිරීම පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් NVQ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම

**ශිල්පීය නිපුණතා :**

- බර වාහනද ඇතුළුව යන්ත්‍ර ක්‍රියාකරවීම හා පැදවීම පිළිබඳ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද ( j කාණ්ඩයේ බලපත්‍රය අනිවාර්ය වේ.)
- බර උපකරණ යන්ත්‍ර නඩත්තුව පිළිබඳව හදාරා ඇති පාඨමාලා හා ඒ පිළිබඳ ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**වැටුප :** රා.ප.ච. 3 / 2016 අනුව PL – 3/2016 වැටුප් කාණ්ඩය යටතේ දෛනික වැටුප් ගෙවනු ලැබේ.

**සේවා කොන්දේසි :** අවශ්‍ය අවස්ථා වලදී බර යන්ත්‍ර උපකරණ වලට අමතරව අනෙකුත් රථ ( කැබ් රථ , ට්‍රැක්ටරය , ටිපර් රථ ආදිය ) පැදවීමට ද හැකි වීම විශේෂ සුදුසුකමක් වේ.

පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත සම්පූර්ණ කර 2023.12.27 දින ප.ව.2.00 ට පෙර ලේකම්, ප්‍රාදේශීය සභාව, තිහගොඩ යන ලිපිනයට ලැබෙන සේ **"ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ලිපි කවරය වම්පස ඉහළ කෙළවරේ බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු සඳහා අයදුම්පත"** යනුවෙන් සඳහන් කළ යුතුය.